

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
කොළඹ 08

H 57390 - 330 (2021/04) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව





රජයේ මුද්‍රණාලයාධිපතිගේ පණිවුඩය

2021 වර්ෂය ශ්‍රී ලංකාවට මෙන්ම සමස්ත ලෝකයටම අභියෝග සහිත වූ වර්ෂයකි. ඒ ගෝලීය වශයෙන් පැතිර ගිය කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ සියලුම ක්‍රියාවලීන් අඩපණ වූ පසුබිමක් තුළ දැඩි සීමාවන්ට යටත්ව අත්‍යවශ්‍ය කාර්යයන් ඉටුකර ගැනීමට සිදුවීම නිසාවෙනි.

කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂය පුරාවටම සමස්ත පුරවැසියන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම පිණිස රටේ සාමාන්‍ය කටයුතු සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලවම හා සීමා කිරීම් වලට යටත්ව සිදු කිරීමට සිදු විය. එම පසුබිම තුළ සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ ඇතුළු අත්‍යවශ්‍ය සේවාවන් පමණක් මුල් කාර්තු තුළ ද පසුව සේවා මුර යටතේ ද ක්‍රියාත්මකව පවත්වා ගන්නා අතරතුර රාජ්‍ය ආයතනයන්හි අති බහුතරයකට නිවසේ සිට රාජකාරි ඉටු කිරීම යන ක්‍රමවේදය ඔස්සේ තම සේවාවන් සැපයීමට සිදු විය.

මෙලෙස උද්ගතව පැවති වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය අංශ, ආරක්ෂක අංශ සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවා සඳහා අනිවාර්යයෙන්ම අවශ්‍ය වූ නිරෝධායන ස්ටිකර්, ඇඳිරි නීති බලපත්‍ර, එන්නත් කාඩ්පත්, සෞඛ්‍ය දැන්වීම් පත්‍රිකා වැනි අත්‍යවශ්‍ය මුද්‍රණ කාර්යයන් ඉටුකර දීමට මෙන්ම අත්‍යවශ්‍ය ගැසට් පත්‍ර ප්‍රකාශයට පත් කිරීම සඳහා ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව පවත්වාගෙන යාමේ දැඩි අභියෝගයට මුහුණ දීමට සිදු වූ බව මෙහිලා සඳහන් කළ යුතුය. මෙහි දී නිවසේ සිට රාජකාරි ඉටු කිරීමේ ක්‍රමවේදයට මෙම දෙපාර්තමේන්තුව මඟින් සැපයිය යුතු සේවාව සැපයිය නොහැකි වූ අතර, සේවය සඳහා කැඳවනු ලැබූ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් විය.

ඉහතින් පැහැදිලි කළ පසුබිම යටතේ වුව ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් අපේක්ෂිත සේවය නොපිරිහෙළා, එමෙන්ම කිසිදු අවස්ථාවක රජය අපහසුතාවයට පත් නොවන පරිදි සැපයීමට හැකියාව ලැබීම සම්බන්ධව මෙහිදී අපි අතිශයින් සතුටු වෙමු. එසේම දැඩි සෞඛ්‍ය අවධානමක් සහිත අතිශය භයානක වසංගතයක් පැතිර යන පසුබිමක් තුළ සෞඛ්‍ය අංශ මඟින් නිර්දේශිත සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රය සෞඛ්‍යාරක්ෂිත කලාපයක් ලෙස පවත්වාගෙන යාමට ලැබීම සමස්ත රජයේ මුද්‍රණාලයීය කාර්ය මණ්ඩලය ලැබූ ජයග්‍රහණයක් බව ප්‍රකාශ කරනුයේ හද පිරි සතුටිනි.

කෝවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ගෝලීය ආර්ථිකය දැඩි පසුබෑමකට ලක් වූ පසුබිමක ශ්‍රී ලංකාවට ද එහි බලපෑම් එල්ලවීම වැළැක්විය නොහැකි තත්ත්වයක් විය. එම තත්ත්වය හමුවේ වුව ද රජයේ අවශ්‍යතා ඉටු කරමින් මහජනතාවට මනා සන්නිවේදන සේවාවක් පවත්වා ගනිමින් මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට ලැබීම සම්බන්ධයෙන් දැඩි සේ සතුටට පත් වන අතර, එම ජයග්‍රහණය ලබා ගැනීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වසංගත රෝග විද්‍යායතනය, ශ්‍රී ලංකා පොලිසිය සහ මෙම අසීරු අවස්ථාවේ තම සේවය

දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉටුකළ කාර්ය මණ්ඩලයට සහ තම රාජකාරී කාර්යයන් අභිබවා යමින් සේවයේ නියුතු වූ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සුභසාධනය වෙනුවෙන් උපරිම දායකත්වයක් දැක් වූ සැමට මාගේ ගෞරව පූර්වක ස්තුතිය මෙහි දී පුද කරමි.

ගංගානි ලියනගේ,

රජයේ මුද්‍රණාලයාධිපති.

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම :- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 211

අන්තර්ගතය *පිටු අංක*

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය **01-06**

1.1 හැඳින්වීම 01

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 02

1.3 ප්‍රධාන කාර්යයන් 03

1.4 සංවිධාන සටහන 04

1.5 දෙපාර්තමේන්තු ප්‍රධාන අංශ 05-06

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 06

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 06

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **07**

2.1 විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 07

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **08-22**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 08

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 09

3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 10

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 12

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 12

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 13-20

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 21

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 21

පිටු අංක

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක **22**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 22

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය **23-26**

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 23-24

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 25-26

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **27-30**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 27

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 27

6.3 මානව සම්පත් සංවර්ධනය 27-30

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **31-41**

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීමේ ප්‍රමුඛතම අපේක්ෂාව පෙරදැරි කරගෙන සියලුම රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වෙමින් නවීන තාක්ෂණික මෙවලම් ඔස්සේ සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකය හා සමගාමී ගමනක නිරත වන රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඉහළ ගුණාත්මක භාවයකින් යුතු මුද්‍රණ නිමැවුම් එළි දක්වනු ලබයි.

ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා, පනත් කෙටුම්පත්, දෙපාර්තමේන්තු රෙගුලාසි ආදිය මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයට අමතරව අණ පනත්, රෙගුලාසි, රජයේ සියලුම පොදු ආකෘතිපත්‍ර, විවිධ අමාත්‍යාංශ සඳහා අවශ්‍ය ආකෘතිපත්‍ර, භාණ්ඩාගාර අයවැය ඇස්තමේන්තු ආදිය මුද්‍රණය කිරීමේ වාණිජ නොවන මුද්‍රණ කටයුතුවල මෙන්ම ආකෘති පත්‍ර, ප්‍රවේශ පත්‍ර, පාසල් පෙළපොත්, දහම් පාසල් පොත්, මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ආකෘති වර්ග, ඡන්ද පත්‍රිකා, විචල්‍ය දත්ත මුද්‍රණය, රජයේ විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සඳහා වන වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා මුද්‍රණය, ලොතරැයි මුද්‍රණය කිරීම් ආදී වාණිජ මුද්‍රණ කටයුතුවල ද මෙම දෙපාර්තමේන්තුව නිරතව සිටී. මෙයට අමතරව පළාත් සභා, පළාත් පාලන ආයතන මෙන්ම අර්ධ රාජ්‍ය ආයතනවල කටයුතු පහසු කරවනු වස් අන්තර්ජාලය හරහා සෘජුවම ගැසට් පත්‍ර මඟින් තොරතුරු සන්නිවේදනය කිරීම ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

වර්තමානය වන විට අන්තර්ජාලය ඔස්සේ, www.documents.gov.lk වෙබ් අඩවියට පිවිස අවශ්‍ය තොරතුරු ඉක්මනින් ලබා ගැනීමේ තාක්ෂණික ක්‍රමවේදය අනුගමනය කරමින් නොනිමි මෙහෙවරක් ප්‍රශස්ත මට්ටමින් ඉටු කරනු ලැබේ. වර්තමානයේ රජයේ මුද්‍රණාලයාධිපති ලෙස කටයුතු කරන ගංගානි ලියනගේ මහත්මියගේ මග පෙන්වීම යටතේ 1284 ක කාර්ය මණ්ඩලයක් කාර්යක්ෂමව තම සේවය නිරන්තරව ලබා දීමට කැප වී සිටී.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයෙහි සමස්ත ශ්‍රී ලංකාවේ සියලුම ක්‍රියාවලීන් අඩපණ වූ පසුබිමක් යටතේ වුව ද සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් රජයට අවශ්‍ය අත්‍යවශ්‍ය මුද්‍රණ සේවා සැපයීමට මෙම දෙපාර්තමේන්තුවට හැකි විය.

තිරසර සංවර්ධන පනත යටතේ මුල් අදියර වශයෙන් වසර 2025 වන විට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ළඟා කර ගත යුතු ඉලක්ක කරා යාමේ පියවරයන්හි අඩිතාලම හඳුනා ගෙන ඇති අතර ආරක්ෂිත මුද්‍රණ ක්‍රමවේදයන් වැඩිදියුණු කර ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතා සපුරාලීම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අපේක්ෂාවයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.2.1 ආයතනයේ දැක්ම:

"මුද්‍රණයේ හා ප්‍රකාශනයේ ජීවනාලිය බවට පත්වීම"

1.2.2 මෙහෙවර:

"කෘතහස්ත කාර්ය මණ්ඩලය නවීන තාක්ෂණය උපයෝගී කරගෙන කලට වේලාවට ගුණාත්මක නිමාවකින් යුතුව සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම"

1.2.3 අරමුණු:

- මුද්‍රණ හා ප්‍රකාශන සේවා කටයුතු උසස් නිමාවකින් සහ නිරවද්‍යතාවයෙන් යුතුව කලට වේලාවට ඉටු කර දීම
- මුද්‍රණ කටයුතුවල ගුණාත්මකභාවය, නිමාව සහ නිර්මාණශීලීත්වය ඉහළ නැංවීම
- නවීන තාක්ෂණය සහ ක්‍රමවේදයන් වර්ධනය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය නැංවීම
- රජයේ සියලුම ප්‍රකාශන පහසු මිලට හා කාර්යක්ෂම ලෙස මහජනතාවට මිල දී ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම
- කළමනාකරණ පද්ධතිය හා ක්‍රියාපටිපාටීන් වැඩිදියුණු කිරීම මඟින්, ගනුදෙනුකරුවන්ට උසස් සේවාවක් සැපයීම
- මානව සම්පත් සංවර්ධනය තුළින් ආකල්පමය වෙනසක් ඇති කිරීම හා එමඟින් සේවාලාභීන් තෘප්තිමත් වන අයුරින් උසස් සේවාවක් සැපයීම
- සේවක ආරක්ෂාව හා සුබසාධනය ඉහළ නැංවීම
- දෙපාර්තමේන්තුව තුළ ප්‍රියමනාප වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් පාරිභෝගිකයන් තෘප්තිමත් වන ආකාරයේ උසස් සේවාවක් ලබා දීම
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ අධිකරණ ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම
- ආරක්ෂිත මුද්‍රණය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීම

1.3 ප්‍රධාන කාර්යයන්

- රජයේ ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තා, පනත් කෙටුම්පත්, දෙපාර්තමේන්තු රෙගුලාසි ආදිය මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීම

- අණ පනත්, රෙගුලාසි, විවිධ අමාත්‍යාංශ සඳහා අවශ්‍ය පෝරම, භාණ්ඩාගාර අයවැය ඇස්තමේන්තු ආදිය මුද්‍රණය කිරීමේ වාණිජ නොවන මුද්‍රණ කටයුතු ඉටු කිරීම

- මුද්දර, ආකෘතිපත්‍ර, ප්‍රවේශපත්‍ර, පාසල් පෙළපොත්, දහම් පාසල් පොත්, මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය සියලු ම පෝරම වර්ග, රජයේ විවිධ අමාත්‍යාංශ සඳහා වන වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා මුද්‍රණය කිරීමේ වාණිජ මුද්‍රණ කටයුතු ඉටු කිරීම

- පළාත් සභා, පළාත් පාලන ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අවශ්‍ය මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම

- විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා ජනතාවට සෘජුවම තොරතුරු කලට වේලාවට ගුණාත්මක නිමාවකින් යුතුව සැපයීම

- අනෙකුත් මුද්‍රණ හා ප්‍රකාශන සේවා සැපයීම

1.4 සංවිධාන සටහන



රජයේ මුද්‍රණාලයාධිපති ශ්‍රී.ලං.මු.සේ. (විශේෂ)
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (පෙර මුද්‍රණ) (ශ්‍රී.ලං.මු.සේ. (විශේෂ)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (තොරතුරු තාක්ෂණ) (ශ්‍රී.ලං.මු.සේ. I)
නි.ර.මු./ස.ර.මු. (මල්ටිමීඩියා) (ශ්‍රී.ලං.මු.සේ II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (ඉලෙක්ට්‍රොනික I) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු.ඉලෙක්ට්‍රොනික II) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (පරිගණක) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි (I)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි (I)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (පෙර මුද්‍රණ) (ශ්‍රී.ලං.මු.සේ. I)
නි.ර.මු./ස.ර.මු. (ප්‍රගතිපාලන හා මිල කිරීම්) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සංස්කාරක) (දිවා) (ශ්‍රී.ලං.මු.සේ. II/II
ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
සහකාර ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සංස්කාරක) (රාත්‍රී) (ශ්‍රී.ලං.මු.සේ. II/III
ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
සහකාර ප්‍රධාන මුද්‍රණ සංස්කාරක
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන/මෙහෙයුම්) (ශ්‍රී.ලං.මු.සේ. (විශේෂ)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (නිෂ්පාදන) (ශ්‍රී.ලං.මු.සේ. I)
නි.ර.මු./ස.ර.මු. (යන්ත්‍ර I) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (යන්ත්‍ර II) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ නිමැවුම් I) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ නිමැවුම් II) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (රහස් I) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (රහස් II) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රජයේ මුද්‍රණාලයාධිපති (මෙහෙයුම්) (ශ්‍රී.ලං.මු.සේ. I)
නි.ර.මු./ස.ර.මු. (ආදායම් හා බෙදාහැරීම්) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ කාර්මික) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සැපයීම් - දේශීය) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (මුද්‍රණ සැපයීම් - විදේශීය) (ශ්‍රී.ලං.මු.සේ. II/II)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (විවිධ සැපයීම්) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (නාරාහේන්පිට) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
නි.ර.මු./ස.ර.මු. (රාත්‍රී) (ශ්‍රී.ලං.මු.සේ. II/III)
ප්‍රධාන වැඩ මූලික (ෆෝමන් I)
වැඩ මූලික (ෆෝමන් II/III)
අතිරේක රජයේ මුද්‍රණාලයාධිපති (පාලන) ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ)
නි.ර.මු./ස.ර.මු. (ආයතන) (ශ්‍රී.ලං.ප.සේ. II/III)
පරිපාලන නිලධාරි I කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
පරිපාලන නිලධාරි II කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
නි.ර.මු./ස.ර.මු. (පාලන) (ශ්‍රී.ලං.ප.සේ. II/III)
පරිපාලන නිලධාරි III කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
පරිපාලන නිලධාරි IV කළ.සේ.නි. (අධි පන්තිය)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී.ලං.ග.සේ.I)
ගණකාධිකාරි (වැටුප් හා ණය අත්තිකාරම්) (ශ්‍රී.ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
ගණකාධිකාරි (ගෙවීම්) (ශ්‍රී.ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
ගණකාධිකාරි (ආදායම් හා තොග පාලන) (ශ්‍රී.ලං.ග.සේ. II/III)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ.I)
අංශ ප්‍රධානි (කළ.සේ.නි. I)
නීති නිලධාරි

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.5.1 නිෂ්පාදන, සැලසුම් හා මෙහෙයුම් අංශය

දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම මුද්‍රණ ඇණවුම් සඳහා වැඩ විස්තරපත් නිකුත් කිරීම, මිල ඇස්තමේන්තු ලබා දීම, මුද්‍රණ කාර්යයන්ට අදාළ පිරිවැය ගණනය කිරීම මෙන්ම බිල්පත් නිකුත් කිරීම හා මුද්‍රණ, පෙර මුද්‍රණ කටයුතු මෙමඟින් ඉටු කරනු ලැබේ. ඒ සඳහා මෙම අංශය යටතේ වැඩ විස්තර පත්‍ර නිකුත් කිරීම්, මිල කිරීම්, නිෂ්පාදන මෙහෙයුම්, මල්ටිමීඩියා, කඩදාසි ගබඩා හා ඉංජිනේරු ගබඩා යන අංශ පවතී.

1.5.2 රහස්‍ය අංශය

ආයතනයට ලැබෙන සියලු රහස්‍ය මුද්‍රණ කටයුතු ඉටු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. මුද්දර, රහස්‍ය හදිසි පනත් හා ගැසට් පත්‍ර, විභාග ප්‍රශ්න පත්‍ර, දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර, දුම්රිය ප්‍රවේශ පත්‍ර මෙන්ම අනෙකුත් රහස්‍ය මුද්‍රණ කටයුතු මෙම අංශය මඟින් ඉටු වේ. රහස්‍ය අංශය යටතේ ලිතෝ යන්ත්‍ර අංශය, රහස් මුද්දර අංශය, ඩිජිටල් අංශය, රිසෝ ග්‍රාන් අංශය, රහස් කියවීම් අංශය, රහස් පොත් බැඳීම් අංශය, හරි වැරදි බැලීම් අංශය, රහස් දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර අංශය සහ රහස් පරිගණක අංශය ආදී අංශ ක්‍රියාත්මක වේ.

1.5.3 පෙර මුද්‍රණ අංශය

මුද්‍රණයට අවශ්‍ය සියලුම පෙර මුද්‍රණ කටයුතු මෙමඟින් ඉටු වේ. ඒ අනුව පරිගණක පිටු සැකසීම, මුද්‍රණයට අවශ්‍ය පොලිමර් මෙන්ම ප්ලේට්ස් සැකසීම මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. පරිගණක අංශ, කියවීම් අංශ, මුද්‍රණ තහඩු නිෂ්පාදන අංශ මේ යටතේ ක්‍රියාත්මක වේ.

1.5.4 මුද්‍රණ අංශය

ලැබෙන මුද්‍රණ කටයුතු විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සිදු කරනු ලබන්නේ මෙම අංශය මඟිනි. මෙම අංශය මඟින් ඡන්ද පත්‍රිකා, රජයේ ආයතනයන්හි භාවිතා කරන පොදු ආකෘති, ගැසට්, පාසල් පොත්, දහම් පාසල් පොත් හා අනෙකුත් මුද්‍රණ කටයුතු සිදු කරන අතර මේ සඳහා වෙබ් අංශය, රොටරි අංශය, කෝඩ් අංශය, සෝඩ් අංශය, ලෙටර් ප්‍රෙස් අංශය යන අංශ පවතී.

1.5.5 පොත් බැඳුම් අංශය

පාරිභෝගිකයාගේ අවශ්‍යතාවය පරිදි මුද්‍රණය කළ හෝ නොකළ කඩදාසි, ලේඛන, පාරිභෝගික පරිහරණයට හා කල් පැවැත්මට පහසු වන ආකාරයට ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් ඒකරාශි කොට බැඳීම හා බැඳීම් කරන ලද පොත් සිත් ගන්නා ලෙස එහි වටිනාකම රඳවන පරිදි නිමාකරණය කිරීම පොත් බැඳීම් අංශයේ ක්‍රියාවලිය වේ. මේ යටතේ, තාක්ෂණයෙන් උසස් නිමවුම්, සාමාන්‍ය හදිසි, හරි වැරදි බැලීම්, නැවත බැඳීම්, පාසල් පොත්, සාමාන්‍ය හදිසි නිමවුම් (P.S), නව ගැදරින් යන කාර්යයන් ඉටු කරනු ලබයි.

1.5.6 බෙදාහැරීම් අංශය

සියලුම මුද්‍රණ නිමැවුම් අදාළ ආයතනයන් වෙත බෙදාහැරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යය වේ. මෙයට අතිරේකව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මුදල් රෙගුලාසි සංග්‍රහය, ආයතන සංග්‍රහය, අපරාධ නඩු විධි විධාන සංග්‍රහය, දණ්ඩනීති සංග්‍රහය වැනි ලේඛන හා තොරතුරු දැන ගැනීමේ පනත් ආදිය

ප්‍රකාශන පියස මඟින් සහන මිලට අලෙවි කරනු ලැබේ. විවිධ බෙදාහැරීම් අංශය, පෝරම ගබඩා අංශය, ගැසට් බෙදාහැරීම් අංශය හා ප්‍රකාශන පියස මේ යටතේ ක්‍රියාත්මක වේ.

1.5.7 පරිපාලන අංශය

ආයතනයේ සියලු පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ පරිපාලන අංශය මඟිනි. මෙම අංශයෙහි කටයුතු ප්‍රධාන වශයෙන් ආයතන හා පාලන ලෙස අංශ දෙකක් යටතේ සිදු කරනු ලැබේ. ආයතන අංශය යටතේ මානව සම්පත්, ආයතන යන අංශත් පාලන අංශය යටතේ තැපැල්, විශ්‍රාම වැටුප්, කාලගණක, ආයතන ණය යන අංශත් පවත්වාගෙන යනු ලැබේ. මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කටයුතු, නඩත්තු හා මෙහෙයුම් ඇතුළු සියලු පරිපාලන කටයුතු සිදු කරමින් ආයතනයේ වෘත්තීය කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිපාලනමය පසුබිම සකස් කර දීම මෙම අංශයෙන් සිදු වේ.

1.5.8 මූල්‍ය අංශය

ආයතනයේ සියලු මූල්‍ය කටයුතු මෙහෙයවීම සිදු කරනු ලබනුයේ මෙම අංශය මඟිනි. ඒ අනුව මෙම අංශයෙහි කටයුතු ප්‍රධාන වශයෙන් වැටුප්, ණය අත්තිකාරම්, ආදායම්, ගෙවීම් හා තොග පාලන වශයෙන් අංශ 5 ක් යටතේ ක්‍රියාත්මක වේ. ආයතනයේ ගිණුම්, වැටුප් හා ණය අත්තිකාරම්, ආදායම්, ගෙවීම් හා තොග පාලන රාජකාරී ඉටු කරමින් වෘත්තීය කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය පසුබිම සකස් කර දීම මෙම අංශයෙන් සිදු වේ.

1.5.9 අභ්‍යන්තර විගණන අංශය

මුදල් රෙගුලාසි 133 හා 2018 අංක 19 දරන විගණන පනතේ 40 41 හා විධිවිධානවලින් ලැබී ඇති බලතල පරිදි දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාමේ පරමාර්ථයෙන් විගණන කාර්යයන් ඉටු කිරීම අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලැබේ.

1.5.10 නිෂ්පාදනයට සෘජු දායකත්වයක් සපයන අංශ

ප්‍රධාන මුද්‍රණ අමුද්‍රව්‍ය වන කඩදාසි ඇතුළු ආයතනයට අවශ්‍ය සියලුම දේශීය විදේශීය සැපයීම්, යන්ත්‍රෝපකරණ නඩත්තු ඇතුළු රාජකාරී මෙමඟින් ඉටු කරනු ලබයි. මේ යටතේ දේශීය සැපයුම් අංශය, විදේශීය සැපයුම් අංශය, වෙනත් සැපයුම් අංශය, ප්‍රවාහන අංශය, ආරක්ෂක අංශය, සුභසාධන අංශය යන අංශ ක්‍රියාත්මක වේ.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව යටතේ ආයතන/ අරමුදල් නොමැත.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි විදේශ ආධාර ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක නොවේ.

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

- ගෝලීය වශයෙන් පැතිර ගිය කොවිඩ් -19 වසංගත තත්ත්වය හමුවේ දැඩි සීමාවන්ට යටත්ව හා සියලුම ක්‍රියාවලීන් අඩපණ වූ පසුබිමක් තුළ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කර ගනිමින් රජය අපහසුතාවයට පත් නොවන ආකාරයට ආයතනික ඉලක්ක ඉටු කර ගැනීම 2021 වර්ෂය තුළ ප්‍රධානම අභියෝගය විය.

- මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ අකුරටම පිළිපදිමින් 2021 වර්ෂයේ සියලු අත්‍යවශ්‍ය, හදිසි හා රහස්‍ය මුද්‍රණ කාර්යයන් නියමිත වේලාවට ඉටු කර දීම අප ලැබූ විශේෂ ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

- සමස්ත ලෝකය පුරාවට කොවිඩ් -19 වසංගතය ව්‍යාප්තව යද්දී සෞඛ්‍ය අංශ මඟින් නිර්දේශිත සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් ආයතන පරිශ්‍රය වසංගත රෝග වලින් තොර කලාපයක් ලෙස පවත්වාගෙන යමින් අත්‍යවශ්‍ය මුද්‍රණ සේවා සැපයීමට හැකි වීම ද අප ලැබූ ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

- නූතන ඩිජිටල් තාක්ෂණයත් සමග ඉතා සීඝ්‍රයෙන් වෙනස් වන ක්ෂේත්‍රයක් වන මුද්‍රණ ක්ෂේත්‍රය තුළ පූර්ණ රාජ්‍ය ආයතනයක් වශයෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව අබියස පවතින ප්‍රමුඛතම අභියෝගය වන්නේ මෙම සීඝ්‍රයෙන් වෙනස් වන තාක්ෂණික පරිසරයට අනුගත වන පරිදි එහි නිෂ්පාදන ක්‍රියාවලිය සකස් කර ගැනීමයි. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ රහස්‍ය මුද්‍රණ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමුඛයා බවට පත්වීමේ ඉලක්කය පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් සකස් කොට ඇත. සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල වන පරිදි හා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට ගෙන මෙම දෙපාර්තමේන්තුව 2020 - 2025 දක්වා දිවෙන පස් අවුරුදු සැලැස්මක් සකස් කොට ඇති අතර, එම සැලැස්මට අනුගතව වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කරමින් අදාළ ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස විධිමත් ක්‍රියාවලියක් ආරම්භ කොට ඇත. මේ යටතේ 2025 වර්ෂය අවසානය වන විට ශ්‍රී ලංකාව තුළ රහස්‍ය මුද්‍රණ කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීමත් ශ්‍රී ලංකා ජනරජයේ සියලුම රහස්‍ය මුද්‍රණ අවශ්‍යතාවයන් සපුරාලීමත් දෙපාර්තමේන්තුවේ ඉලක්කය වේ.

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ - එෆ්

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2021

	සටහන	තත්‍ය වර්තමාන වර්ෂය 2021 (රු.)	ඉකුත් වර්ෂය 2020 (රු.)	
ආදායම් ලැබීම්				
ආදායම් බදු	1	-	-	
දේශීය භාණ්ඩ හා සේවා බදු	2	-	-	
ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
බදු නොවන ආදායම් හා වෙනත්	4	756,670,731	1,040,558,609	ඒසිඒ-1
මුළු ආදායම් ලැබීම් (අ)		**756,670,731**	**1,040,558,609**	
ආදායම් නොවන ලැබීම්				
භාණ්ඩාගාර අග්‍රිම		2,484,685,000	2,138,566,000	ඒසිඒ-3
තැන්පතු		338,681,977	499,994,675	ඒසිඒ-4
අත්තිකාරම් ගිණුම්		74,204,866	52,340,393	ඒසිඒ-5/5(ඒ)
වෙනත් ලැබීම්		43,522,036	393,097,856	
මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**2,941,093,879**	**3,083,998,924**	
මුළු ආදායම් ලැබීම් හා මුළු ආදායම් නොවන ලැබීම් (ඇ)=(අ)+(ආ)		**3,697,764,610**	**4,124,557,533**	
භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		9,936	819,759	
ශුද්ධ ආදායම් ලැබීම් හා මුළු ආදායම් නොවන ලැබීම් (ඉ)=(ඇ)-(ඈ)		**3,697,754,674**	**4,123,737,774**	
අඩුකළා : වියදම්				
පුනරාවර්ථන වියදම්				
වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,450,478,637	1,528,081,543	
අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,519,666,669	1,345,973,954	ඒසිඒ-2(ii)
සහනාධාර ප්‍රදාන හා මාරුකිරීම්	7	6,150,586	7,107,305	
පොලී ගෙවීම්	8	-	-	
වෙනත් පුනරාවර්ථන වියදම්	9	1,749,621	-	
මුළු පුනරාවර්ථන වියදම් (ඊ)		**2,978,045,513**	**2,881,162,802**	
මූලධන වියදම්				
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	59,657,528	41,497,842	
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	126,147,194	109,791,006	
ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ 2(ii)
මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
හැකියා වර්ධනය	14	1,938,870	1,455,637	
වෙනත් මූලධන වියදම්	15	-	-	
මූලධන වියදම් (උ)		**187,743,592**	**152,744,485**	
තැන්පතු ගෙවීම		198,481,696	393,591,542	ඒසිඒ-4
අත්තිකාරම් ගෙවීම		69,906,013	51,899,854	ඒසිඒ-5/5(ඒ)
වෙනත් ගෙවීම්		36,207,167	68,714,961	
ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**304,594,876**	**514,206,357**	
මුළු වියදම (එ)= (ඊ+උ+ඌ)		**3,470,383,981**	**3,548,113,644**	
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය (ඒ) =(ඉ-එ)		**227,370,693**	**575,624,130**	
ආග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**227,370,693**	**575,574,130**	
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	**50,000**	
		-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ACA - P

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 31 දිනට

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
		2021	**2020**
		(රු.)	(රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,322,195,498	1,203,966,963
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5	230,016,227	234,315,080
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	50,000
වැටි බදු පාලන ගිණුම		367,482	6,947,387
මුළු වත්කම්		**1,552,579,207**	**1,445,279,430**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(71,235,559)	79,843,479
දේපල පිරියත හා උපකරණ සංචිතය		1,322,195,498	1,203,966,963
ජංගම වත්කම්			
තැන්පතු ගිණුම	ඒසිඒ-4	301,619,268	161,418,988
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	50,000
මුළු වගකීම්		**1,552,579,207**	**1,445,279,430**

පිටු අංක 07 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු හා සටහන් පිටු අංක 27 සිට 43 දක්වා ඇතුළත් අනෙකුත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තා කරන ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී
නම:- වී.පී.කේ. අනුෂ පැල්පිට	නම:- ජී. කේ. ඩී. ලියනගේ	නම:- ඩී. වී. ඩබ්. බෙත්මගේ
තනතුර:- ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය	තනතුර:- රජයේ මුද්‍රණාලයාධිපති	තනතුර:- ප්‍රධාන ගණකාධිකාරී
දිනය:- 2022.05.09	දිනය:- 2022.05.09	දිනය:- 2022.05.09

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
	2021	**2020**
	(රු.)	**(රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	744,027,760	1,028,909,366
ආදායම් නොවන ලැබීම්	-	6,602,908
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	57,360,351	52,535,264
අග්‍රිම ලැබීම්	2,484,685,000	2,138,566,000
අත්තිකාරම් අය කර ගැනීම්	72,631,821	54,176,094
තැන්පතු ලැබීම්	338,681,977	499,994,675
වෙනත් ප්‍රදාන ලෙජර් ගිණුම් ලැබීම්	43,522,036	386,494,948
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,740,908,946**	**4,167,279,254**
අඩු කළා - මුදල් වැය කිරීම		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,830,791,524	2,765,428,177
සහනාධාර සහ මාරු කිරීම්	7,900,207	7,107,305
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	416,623,191	728,230,333
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	9,936	819,759
අත්තිකාරම් ගෙවීම්	68,650,145	51,639,104
තැන්පතු ගෙවීම්	198,481,696	393,591,542
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	36,207,167	68,714,961
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**3,558,663,868**	**4,015,531,179**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	182,245,078	151,748,075
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම	182,245,078	151,698,075
	182,245,078	**151,698,075**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) =(ඈ) -(ඉ)	(182,245,078)	(151,698,075)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ)+(ඊ)	-	**50,000**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඒ) = (ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස් වීම (ඔ) = (උ)+(ඒ)	-	50,000
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	**50,000**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) <u>වාර්තාකරණ කාල පරිච්ඡේදය</u>

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) <u>ආදායම් හඳුනා ගැනීම්</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනා ගනු ලැබේ.

(4) <u>දේපල, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනා ගනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5) <u>දේපල, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපල, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි වලින් සමන්විත වේ.

(7) <u>මූල්‍ය වාර්තාවල ආකෘතීන්හි වෙනස්කම් හා සංසන්දනාත්මක අගයන්වල ගැලපීම</u>

2021 වර්ෂයේ මූල්‍ය වාර්තාවලට අනුකූලව 2020 වර්ෂයේ අගයන්වල අදාළ වන ගැලපීම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තු
20.03.02.05	රජයේ මුද්‍රණාලයේ ලැබීම්	800,000,000.00	500,000,000.00	756,670,731.00	151%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.3,084,658,000.00	රු.3,084,658,000.00	රු.2,978,045,514.00	96%
ප්‍රාග්ධන	රු.393,300,000.00	රු.393,300,000.00	රු.187,743,592.00	47%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු. අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජනාධිපති කාර්යාලය	1-1-4-37-1508-0	මුද්‍රණ බිල්පත් පියවීම	16,000,000.00	16,000,000.00	16,000,000.00	100%
2	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	005-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	304,398.00	304,398.00	304,398.00	100%
3	ජාතික පොලිස් කොමිෂන් සභාව	008-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	134,784.00	134,784.00	134,784.00	100%
4	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	010-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	144,698.40	144,698.40	144,698.40	100%
5	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	010-1-1-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	116,640.00	116,640.00	116,640.00	100%
6	මුදල් කොමිෂන් සභාව	011-1-1-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	338,933.70	338,933.70	338,933.70	100%
7	බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	67,338.00	67,338.00	67,338.00	100%
8	බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	168,264.00	168,264.00	168,264.00	100%
9	බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-2-5-6-1508-0	මුද්‍රණ බිල්පත් පියවීම	172,800.00	172,800.00	172,800.00	100%
10	බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-2-5-8-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	24,786.00	24,786.00	24,786.00	100%
11	බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	101-2-6-0-1409-8	මුද්‍රණ බිල්පත් පියවීම	1,684,866.42	1,684,866.42	1,684,866.42	100%
12	ආරක්ෂක අමාත්‍යාංශය	103-1-3-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	46,753.20	46,753.20	46,753.20	100%
13	ආරක්ෂක අමාත්‍යාංශය	103-1-3-0-1205-0	මුද්‍රණ බිල්පත් පියවීම	12,738.41	12,738.41	12,738.41	100%
14	ජනමාධ්‍ය අමාත්‍යාංශය	105-1-3-0-2001-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,373,862.00	1,373,862.00	1,373,862.00	100%
15	අධිකරණ අමාත්‍යාංශය	110-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	82,728.00	82,728.00	82,728.00	100%
16	අධිකරණ අමාත්‍යාංශය	110-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	113,119.20	113,119.20	113,119.20	100%
17	අධිකරණ අමාත්‍යාංශය	110-1-3-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	3,083,940.00	3,083,940.00	3,083,940.00	100%

අනු. අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
18	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	810,622.08	810,622.08	810,622.08	100%
19	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,792,156.80	1,792,156.80	1,792,156.80	100%
20	ශික්ෂණ රෝහල - මහනුවර	111-1-5-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,046,520.00	1,046,520.00	1,046,520.00	100%
21	ජාතික රුධිර පාරවිලයන සේවය	111-1-5-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	9,722,764.80	9,722,764.80	9,722,764.80	100%
22	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-2-13-3-2509-38	මුද්‍රණ බිල්පත් පියවීම	744,035.22	744,035.22	744,035.22	100%
23	පවුල් සෞඛ්‍ය කාර්යාංශය	111-2-14-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	537,570.00	537,570.00	537,570.00	100%
24	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-2-14-13-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,451,628.00	1,451,628.00	1,451,628.00	100%
25	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-2-14-31-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	816,996.96	816,996.96	816,996.96	100%
26	සෞඛ්‍ය අමාත්‍යාංශය	111-2-20-1-2401-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,475,600.00	1,475,600.00	1,475,600.00	100%
27	වෙළෙඳ අමාත්‍යාංශය	116-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,299,251.40	1,299,251.40	1,299,251.40	100%
28	මහවැලි කෘෂිකාර්මික වාරිමාර්ග ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය	118-2-3-62-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	4,375,814.40	4,375,814.40	4,375,814.40	100%
29	අධ්‍යාපන අමාත්‍යාංශය	126-2-5-1-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	378,000.00	378,000.00	378,000.00	100%
30	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	141,912.00	141,912.00	141,912.00	100%
31	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	451,359.00	451,359.00	451,359.00	100%
32	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	130-1-2-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	930,925.17	930,925.17	930,925.17	100%
33	කර්මාන්ත අමාත්‍යාංශය	149-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	45,360.00	45,360.00	45,360.00	100%
34	කර්මාන්ත අමාත්‍යාංශය	149-2-3-1-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	12,960.00	12,960.00	12,960.00	100%

අනු. අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
35	පරිසර අමාත්‍යාංශය	160-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	171,450.00	171,450.00	171,450.00	100%
36	පරිසර අමාත්‍යාංශය	160-2-3-118-2507-0	මුද්‍රණ බිල්පත් පියවීම	1,673,387.00	1,673,387.00	1,673,387.00	100%
37	පරිසර අමාත්‍යාංශය	160-2-3-120-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	374,887.00	374,887.00	374,887.00	100%
38	තාක්ෂණ අමාත්‍යාංශය	186-1-1-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	820,854.00	820,854.00	820,854.00	100%
39	කම්කරු අමාත්‍යාංශය	193-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	43,200.00	43,200.00	43,200.00	100%
40	තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය	194-1-2-0-1409-99	මුද්‍රණ බිල්පත් පියවීම	320,716.80	320,716.80	320,716.80	100%
41	වාරිමාර්ග අමාත්‍යාංශය	198-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	382,622.40	382,622.40	382,622.40	100%
42	වාරිමාර්ග අමාත්‍යාංශය	198-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	67,500.00	67,500.00	67,500.00	100%
43	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	350,460.00	350,460.00	350,460.00	100%
44	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-0-1409-7	මුද්‍රණ බිල්පත් පියවීම	564,580.00	564,580.00	564,580.00	100%
45	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-0-1409-11	මුද්‍රණ බිල්පත් පියවීම	76,599.00	76,599.00	76,599.00	100%
46	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-0-1409-12	මුද්‍රණ බිල්පත් පියවීම	64,800.00	64,800.00	64,800.00	100%
47	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-0-1409-14	මුද්‍රණ බිල්පත් පියවීම	113,022.00	113,022.00	113,022.00	100%
48	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-1-1501-0	මුද්‍රණ බිල්පත් පියවීම	201,385,988.00	201,385,988.00	201,385,988.00	100%
49	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	201-2-2-11-2205-4	මුද්‍රණ බිල්පත් පියවීම	203,580.00	203,580.00	203,580.00	100%
50	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	206-2-2-1-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	2,262,114.00	2,262,114.00	2,262,114.00	100%
51	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	206-2-3-6-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	211,923.00	211,923.00	211,923.00	100%

අනු. අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	වැය ශීර්ෂය	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම්	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
				මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
52	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	210-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	88,641.00	88,641.00	88,641.00	100%
53	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	210-1-2-0-1409-21	මුද්‍රණ බිල්පත් පියවීම	156,438.00	156,438.00	156,438.00	100%
54	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	210-1-2-0-2001-0	මුද්‍රණ බිල්පත් පියවීම	2,550,123.00	2,550,123.00	2,550,123.00	100%
55	ආයුර්වේද දෙපාර්තමේන්තුව	220-1-1-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	178,000.20	178,000.20	178,000.20	100%
56	ආයුර්වේද දෙපාර්තමේන්තුව	220-2-3-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	743,040.00	743,040.00	743,040.00	100%
57	ආයුර්වේද දෙපාර්තමේන්තුව	220-2-3-8-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	514,080.00	514,080.00	514,080.00	100%
58	ආයුර්වේද දෙපාර්තමේන්තුව	220-2-4-2-2509-0	මුද්‍රණ බිල්පත් පියවීම	169,668.00	169,668.00	169,668.00	100%
59	කම්කරු දෙපාර්තමේන්තුව	221-1-1-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	252,234.00	252,234.00	252,234.00	100%
60	කම්කරු දෙපාර්තමේන්තුව	221-2-3-0-1409-0	මුද්‍රණ බිල්පත් පියවීම	123,120.00	123,120.00	123,120.00	100%
61	ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	222-1-2-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	15,781,073.40	15,781,073.40	15,781,073.40	100%
62	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය	224-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	411,156.00	411,156.00	411,156.00	100%
63	පොලිස් මූලස්ථානය	225-1-1-0-1205-0	මුද්‍රණ බිල්පත් පියවීම	850,391.46	850,391.46	850,391.46	100%
64	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව	226-1-1-0-1201-0	මුද්‍රණ බිල්පත් පියවීම	263,952.00	263,952.00	263,952.00	100%
